“නෑ ඩොක්ටර්.. මං පයින්ම යන්නං” ඉසුර අඳුරුකරගත් මුහුණින් යුතුවම කීවේ ය.

“අපි යන්නං ඉසුර... ආයෙ හමුවෙමු...” මේනක වාහනය ඉදිරියට ගත්තේ ය. ඉසුරගේ පිළිතුර සිනාවක් පමණක් විය. මේනක ගේ වාහනය පිටත්ව යන තෙක්ම ඉසුර නැවතී බලා සිටියේ ය.

“අයිය කිව්වට අයියම නෙවෙයි නේද” පසුපස බලන කන්නාඩියෙන් ඈත නොපෙනී යන ඉසුර දෙස බලමින් මේනක අසයි.

“ගමේ අපට වැඩමල් හැමෝම අයියලා අක්කලා නැන්දලා මාමලා තමයි ඩොක්ටර්.. ඒව නෑකම් නෙවෙයි.. හිතවත්කම්”

“ඇයි ඒ අයියා මාව දැක්කම මූන නරක් කර ගත්තෙ? එයා කලබල වුණා”

“එයා විතරක් නෙවෙයි මාත් කලබල වුණා.. ඩොක්ටර් මේ විදිහට දුප්පත් මං බලන්න එයි කිය ස්නේහාගේ සිල මම හීනෙකින්වත් හිතුවෙ නැහැ” ස්නේහා කීවා ය. මේනක පිළිතුරක් ලෙස කිසිවක් නොකීවේ ය. ඔහු කල්පනාවකට වැටී සිටියේ ය.

“මං ආව එක හරි නෑ වගේ ද?” ඔහු සෑහෙන වේලාවකට පසු ඇසුවේ ය.

“නෑ සර්.. එහෙම ප්‍රශ්නයක් නැහැ... තාත්තත් සතුටුවෙයි සර් දැක්කම..” ස්නේහා කීවා ය.

“ඒ කතාව ඇහුවම තමයි ඇඟට ලේ ටිකක් ඉනුවෙ.. ඇත්තටම මං මෙහෙටම ආව නෙවෙයි.. යාලුවෙකුගෙ වැඩකට නුවර ආවා.. ඒ ගමන් මෙහෙත් එන්න හිතුවා” ඔහු කීවේ ය. යාලුවා අකලංකදැයි අසන්නට ස්නේහාට සිතුණි. ඇය ඒ සිතුවිල්ල යටපත් කරගත්තේ මහත් වෑයමිනි.

“අකලංකට කුමක් වීද?” ඒ පැනය ස්නේහාගේ සිතට වරින්වර වද දෙයි. ඔහු පිලිබඳ විස්තර සොයා දැන ගැනීමේ කුතුහලය දැඩිව දැනෙන මුත් මේනකගෙන් ඒ ගැන අසන්නට ඇයට නොසිතෙයි. එය අනවශ්‍ය ප්‍රශ්නයක් නැවත ඇතිකර ගැනීමක් වනු ඇත. වසා දැමූ පරිච්ඡේදයක් නැවත පෙරළා කියවීමේ අවශ්‍යතාවක් නැත. තමන්ගේ ජීවිතය උඩු යටිකුරු කළ ආගන්තුකයා පිළිබඳ සිතා වෙහෙස වියයුතු නැති බව බුද්ධිය කීවද තේරුම්ගත නොහැකි කැළඹීමක් සිතේ කොණක ඇති බව ඇයට දැනෙයි.

ගෙදර ළඟට එන තෙක්ම මේනකත් ස්නේහාත් සිටියේ තම තමන්ගේ කල්පනා ලෝකවල ය.

“වෙච්ච දේවල් තාත්ත දන්නවද?” වාහනය ගේ ඉදිරියේ පාරේ නැවැත්වූ පසු මේනක ඇසුවේ ය.

“මං විස්තර කරල කිව්වෙ නැහැ.. ඒත් තාත්තට තේරෙනව කියල මං දන්නවා” ස්නේහා කීවා ය.

“ඒක හොඳයි.. දේවල් හංගගෙන කතා කරන එක හරිව වදයක්” මේනක කීවේ වාහනයෙන් බසින අතර ය.

**මතු සම්බන්ධයි**

**23 වන පිටෙන්**

වෙනස්ය. ප්‍රතිකර්මය ඒ සියලු තුවාලකරුවන් ඇතුළත් වන්නක් විය යුතුයි.

එහිදී මෙතෙක් ගත් ප්‍රවේශය වෙනස් කරගැනීම අවශ්‍ය යැයි මම විශ්වාස කරමි. මෙතෙක් ගත් ප්‍රවේශවල මාගේ නිරීක්ෂණය වන්නේ සියලු දෙනා සුවපත් කරන ක්‍රමවේදයකට වඩා විශේෂ තුවාල ලත් අය පමණක් වෙන්කොට ගන්නා ක්‍රමවේදයකි. අවබෝධයේ පහසුව සඳහා එහි ප්‍රතිපල පිළිබඳ නිදසුනක් දෙකක් මෙහිදී ඉදිරිපත් කරමි.

එක් අවස්ථාවක දී කොළඹ බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ පැවැති නව නිර්මාණකරුවන්ගේ නිර්මාණ ප්‍රදර්ශනයකට නිර්මාණ ඉදිරිපත් කළ අය අතරේ අම්පාරේ සිට පැමිණි අයෙකුද, යාපනයේ සිට පැමිණි අයෙකුද වූහ. දෙදෙනා අතර කතාබහක් ඇතිවිය. අම්පාරේ සිට පැමිණි සිංහල තරුණයාද යුද්ධයෙන් බොහෝ පීඩාවට පත්වූවෙකි. පවුලේ සාමාජිකයන් අහිමිවූ, අධ්‍යාපනය කඩකප්පල් වූ අයෙකි. යාපනයෙන් පැමිණ සිටි අයගේ තත්ත්වයේද වැඩි වෙනසක් නොවීය. ප්‍රදර්ශනය නැරඹීමට පැමිණෙන දේශපාලකයන් මේ අය සිටින ප්‍රදේශයට නොපැමිණේ. සංචාරක කුටි ඇති ප්‍රදේශය නිරීක්ෂණය කර ආපසු යති. සිය නිර්මාණ ප්‍රදර්ශනයට ඉදිරිපත් කළද කිසිවෙකුත් ඒවා බලන්නට නොපැමිණීම ගැන දෙදෙනා අතර ඇතිවූ සංවාදයේදී යාපනයේ මිත්‍රයා කියා තිබුණේ

''ඔයාලානම් සිංහල. ඔයාලට මොනව හරි කරගන්න පුළුවන්. අපිට තමයි ඉතිං...'' ආදී වශයෙන් වන අදහසකි.
මේ ගැන මා හා පවසමින් අම්පාරේ තරුණයා කිව්වේ

''බලන්න හාමුදුරුවෝ එයා මෙහෙම කිව්වා. මම කොච්චර දුක් විඳිනවාද කියලා දන්නේ මමනේ. මේ නිර්මාණය අරගෙන අතෙන්ට මෙතෙන්ට යන්න කීවාම මම ලොරිවල දාගෙන කියන කියන තැනට ගෙනියනවා. මට අදායමක් ඇත්තෙත් නෑ. මම කොයිතරම් පීඩිතයෙක්ද කියන එක දන්නේ මම. එහෙම තියෙද්දි මම විඳින පීඩාව ගැන කිසි දැනීමක් නැතිව මම වරප්‍රසාද ලත් කෙනෙක් විදිහට හිතන එක මට කොයිතරම් අමාරුද ?'' යනුවෙනි.
සංහිඳියාව, වඩා හොඳ සමාජයක් දෙසට යන සාකච්ඡාව තුළ අනෙකුත් ජන කණ්ඩායම් සම්බන්ධයෙන් වන පිළිතුරක් ගොඩනැඟිය යුතු වන්නේ සිංහල ජන ප්‍රජාව විඳින පීඩිත භාවයෙන් ඔවුනුත් මුදා ගන්නා පිළිතුරක් තුළය. වෙනත් විදිහකට කියන්නේ නම් ජාතිවාදය අවුස්සා මැතිවරණ දිනාගන්නා දේශපාලකයන්ව පත් කරන්නේ සාමාන්‍ය මිනිස්සුය. දේශපාලකයන් ජාතිවාදය ආගම්වාදය ඇවිස්සුවාම ඒ අනුව බෙදිලා ඡන්දය දෙන මිනිස්සුන්ට වගකීමක් ජාතිවාදී ආගම්වාදී දේශපාලනය පෝෂණය කිරීම සම්බන්ධයෙන් වගකීමක් පැවරේ. එසේ ගත් විට ජාතිවාදී ආගම්වාදී අන්තයේ සිට සිය ඡන්දය දෙන පුද්ගලයා අයත් වන්නේද පීඩකයාගේ ගොඩටය.

අප විමසා බැලිය යුතු ප්‍රශ්නය වන්නේ ජාතිවාදය ආගම්වාදය අවුස්සන විට එයට ඡන්දය දෙන තැනට පත්වන පුද්ගලයා එසේ පත්වන්නේ ඇයිද යන්නයි. ඒ පුද්ගලයාට තිබෙන බිය කුමක්ද? පීඩාව කුමක්ද? ඔහුට ඇති නොවිසඳුනු ප්‍රශ්න මොනවාද? සංහිඳියාව පිළිබඳ කෙරෙන සමස්ථ සාකච්ඡාව තුළ මේ කාරණාද ඇතුළත් විය යුතුය. සුවපත්වීමක් දෙසට යනවිට හමුවන ප්‍රධාන බාධකය මේ කොටස අත්හැරීම යැයි මම සිතමි.

එනිසා මම යෝජනා කරන්නේ මේ භික්ෂූන්ද ඇතුළත්ව අන්තවාදයට යන සියල්ල හෙවත් පීඩකයාද සුවපත් කරන වැඩ පිළිවෙළකි. පීඩිතයාගේ සුවපත්වීම දකිනු හැක්කේ එවැන්නක් තුළය. පීඩකයාට ඇති බිය, තුවාල සහ පීඩකයා ගොඩගන්නා වැඩ පිළිවෙළ බොහෝ දුරට මේ දක්වා සුවපත්වීම සඳහා වන ප්‍රවේශයන් තුළ ගිළිහී ඇති බව මගේ විශ්වාසයයි. මෙය ජනතාව අතරට ගෙන යන්නේ කෙසේද යන්න ඉතා වැදගත්ය. මෑතක කැළණිය විශ්වවිද්‍යාලයේ පැවැති වැඩමුළුවකදී මම බුදු පිළිම තැබීම ගැන කතා කළෙමි. සාකච්ඡාවට සහභාගිවූවන්ගෙන් මම මුළින්ම විමසා සිටියේ 'අල්ලාහ් හු අක්බර්' කීවිට ඔබලාට එන අදහස කවරාකාරද යන්නයි. සභාවේ සිටි ශිෂ්‍ය පිරිස ප්‍රකාශ කළේ අල්ලාහ් හු අක්බර් කියන විට මතක් වන්නේ ආයුධයක් අරගෙන වෙඩි තියන මනුෂ්‍යයෙකු බවය. නැතිනම් දරුණු ආකාරයෙන් පුද්ගලයෙකුගේ ගෙළ සිඳින මනුෂ්‍යයෙකු බවය. එවැනි දරුණු දේවල් පිළිබඳ අදහසක් මිස වෙනත් කිසිවක් නොවන බවය. නමුත් අල්ලාහ් හු අක්බර් යන්නෙහි අදහස 'දෙවියන්වහන්සේ ශ්‍රේෂ්ඨයි' යන්නය. එසේ නම් අල්ලාහු හු අක්බාර් කී විට ඉස්ලාම් අයෙකුගේ සිතේ පහළ වන සංකල්පය එක් ආකාරයක්ද, අනෙක් පිරිසකගේ සිතේ පහළ වන්නේ ඊට හාත්පසින්ම වෙනස් ආකාරයේ අන්තර්ජාලයෙන් දුටු දරුණු දර්ශන තුළින් ගොඩනැගුණු සංකල්ප බවත් මම පැහැදිලි කර දුන්නෙමි. එය ඔවුන්ට හොඳින් අවබෝධ විය.

අනතුරුව මම ඔවුනට පහදා දුන්නේ ඔය කාරණය බුදු පිළිමය සම්බන්ධයෙන්ද ඔය ආකාරයෙන්ම සිදුවිය හැකි බවය. එය පැහැදිලි කිරීම සඳහා උතුරේදි හමුවූ තරුණයෙකුගේ අත්දැකීමක් ද ඉදිරිපත් කළෙමි. ඔහු මට කියූ දේ මෙසේය.
'යුද්ධය පවතින කාලයේ මීටර් පන්සීයෙන් පන්සීයට මුර කපොළු තිබුණා. ඒ අතීතය ඇස් දෙක පියාගෙන මතක් කළොත් වැලි කොට්ට තියනවා පේනවා. හමුදා භටයන් ඉන්නවා පේනවා. යකඩ බැරිගේට් තියනවා. සොල්දාදුවෝ වන්දනා කරන බුදු පිළිමයක් තිබෙනවා. මේ තැන පහුකරන්න අපි හරි බයයි. මෙතැනදි සමහරවිට අපිව ප්‍රශ්න කරනවා. සමහර විට අත්අඩංගුවට ගැනීම් සිදුවෙනවා. සමහරු අතුරුදහන් වෙනවා. සමහර තරුණ ශිෂ්‍යාවන් අන්තිම වතාවට දැක්කේ මේ මුරපොළේදි කියන එක අපි දන්නවා. මේ මුර කපොල්ල එක්ක අපේ තියන මතකය බොහොම බිය උපදවන එකක්.

ගැටුම් අවසන් වුණාට පස්සේ මේ මුර කපොළු, හමුදා කඳවුරු, ඒ අය ඉවත් කරගෙන ගියා. ගොඩගහලා තිබුණු වැලි කොට්ට විනාශ වෙලා ගියා. ඒත් හමුදාව යනකොට බුදු පිළිමය ගලවගෙන යන්නේ නෑ. එය ඒ තැන එහෙමම තියනවා. අදටත් මම ඒ තැන් පහුකරන කොට බුදු පිළිමය දකින විට අර පරණ මරණ බය මට දැනෙනවා.'

මේ කතාව කියා මම සිසුනට අවධාරණය කළේ මෙම විශ්වවිද්‍යාලය ඉදිරිපිට සවිකර ඇති බුදු පිළිමය පවා හැම දෙනාටම එකම අදහසක් දෙනවා කියා නොසිතන ලෙසය. මේ අත්දැකීම ආශ්‍රයෙන් අනෙකාට දැනෙන්නේ කොහොමද කියන එක ගැන අපි අවබෝධ කරගත යුතුය. ඒ අවබෝධය තිබෙනවා නම් තුවාලයකට ලුණු දාන්නාක් මෙන් පීඩිතභාවයෙන් සිටින මිනිසුන් අතරට වහා ගොස් බුදු පිළිම සවි කිරීමට නොයනු ඇත. බුදු පිළිම සවි කිරීම තුළ පෙන්වන්නේ අනෙකා පිළිබඳ කොතරම් අසංවේදීද යන බවය.

උතුරේ ගැටුම් පැවැති ප්‍රදේශවල බුදු පිළිම සවි කිරීම නුසුදුසු බව ළමයින්ට මම මුලින්ම කීවා නම් ඔවුනට එය නොතේරෙනු ඇත. ළමයින් එය තේරුම් ගත්තේ මා කලින්ම අල්ලාහ් හු අක්බර් පිළිබඳ කළ කරුණු විමසීම මත්තෙහි වූ බැවිනි. සංහිඳියාවෙ පිළිබඳ පනිවිඩය ගෙන යා යුතු ආකාරය පවා සුවිශේෂීය.



ඔබට ඔබේ පුංචි දරුවා බුද්ධිමත් කිරීමට අවශ්‍යද? දරුවාට සුරංගනා කතා කියා දෙන්න.
ඔබට ඒ දරුවා තවත් බුද්ධිමත් කිරීමට අවශ්‍යද? දරුවාට තව තවත් සුරංගනා කතා කියා දෙන්න.

ඇල්බට් අයින්සටයින්